සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 213-226
ISSN 1800-1459

# දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතියේ අදාළත්වය: ශ්‍රී ලංකාව ඇසුරින් අධ්‍යයනයක්

**ප්‍රදීප් උළුවඩුගේ, එච්.රංජිත් සහ ජී.සී.එල්. පතිරණ**

සමාජීය විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතියට ඇතුළත් අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය සහ සංධානයන් අදාළ වන ආකාරය සහ ශ්‍රී ලංකාවේ දේශීය නීති ක්ෂේත්‍රයට අන්තර්ජාතික නීතිය අදාළ කර ගැනීමේදී මුහුණ පෑමට සිදුවී ඇති ගැටලුන් සේපාල ඒකනායක එදිරිව නීතිපති නඩු තීන්දුව (Sepala Ekanayake Vs. Attorney General) සහ නල්ලරත්නම් සිංගරාසා එදිරි ව නීතිපති නඩු තීන්දුව (Nallarathnam Vs. Attorney General) ඇසුරින් විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය එකම නීති පද්ධතියක් ද? යන්න විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ, අධ්‍යයන ගැටලුවයි. අධ්‍යයන සොයාගැනීම් වලට අනුව; ශ්‍රී ලංකාව දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතියට ඇතුළත් අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ඒකීය න්‍යායවාදයත්, දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික සංධානයන් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ද්වීත්ව න්‍යායවාදයත් අනුගමන කරනු ලබන බව අනාවරණය විය. එමෙන් ම ඒකීය න්‍යායවාදයේ හා ද්වීත්ව න්‍යායවාදයේ සංකලනයක් යොදා ගැනීම ඔස්සේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතීන් අදාළ කර ගැනීම සුජාතභාවයකින් යුක්ත ව කළ හැකි ය යන බව ද මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය. ඒ සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලබාගැනීමට වතමන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බව මෙම අධ්‍යයනයේ දී අවසන් වශයෙන් යෝජනාවක් ලෙස ඉදිරිපත් කරනු ලැබී ය.

**කේන්ද්‍රීය වචන:** අන්තර්ජාතික නීතිය, දේශීය නීතිය, ඒකීය න්‍යායවාදය, ද්වීත්ව න්‍යායවාදය, අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය

## හැඳින්වීම

අන්තර්ජාතික නීතිය, දේශීය නීති ක්ෂේත්‍රයට (දේශීය අධිකරණ බල ක්ෂේත්‍රයට) අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ලොව පිළිගත් එක් මූලධර්මයක් නොමැත. ලොව රාජ්‍යයන් ප්‍රධාන නීති න්‍යායන් දෙකක් එනම්, ඒකීය න්‍යායවාදය (Monism Theory) සහ ද්වීත්ව න්‍යායවාදය (Dualism Theory) අන්තර්ජාතික නීතිය, දේශීය නීති ක්ෂේත්‍රයට අදාළ කර ගැනීමේ දී භාවිත කරනු ලැබේ. එහිදී ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය, ඕස්ට්‍රියාව වැනි රාජ්‍යයන් ඒකීය න්‍යායවාදයත්, එක්සත් රාජධානිය, අයර්ලන්තය වැනි රාජ්‍යයයෝ ද්වීත්ව න්‍යායවාදයත් අනුගමනය කරති. මීට වෙනස් ව ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව වැනි රාජ්‍යයන් අන්තර්ජාතික නීතිය, දේශීය නීති ක්ෂේත්‍රයට අදාළ කර ගැනීමේ දී ඒකීය න්‍යායවාදයේ සහ ද්වීත්ව න්‍යායවාදයේ මිශ්‍රණයක් (mixed monist-dualist system) භාවිත කරනු ලැබේ (Edwin, 1940). ශ්‍රී ලංකාව දේශීය අධිකරණ බල ක්ෂේත්‍රය තුළට අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ඒකීය න්‍යායවාදයත්, අන්තර්ජාතික සංධානයන් අදාළ කර ගැනීම සම්බන්ධයෙන්

ද්විත්ව න්‍යායවාදයත් අනුගමනය කරනු ලැබේ (ඩයස් 1997). එය සමහර අවස්ථාවන්වලදී යම් යම් නෛතික ගැටලු ඇති කිරීමට හේතු සාධක වී ඇති බව සේපාල ඒකනායක එදිරිව නීතිපති නඩු තීන්දුව (Sepala Ekanayake Vs. Attorney General), නල්ලරත්නම් සිංගරාසා එදිරිව නීතිපති නඩු තීන්දුව (Nallarathnam Vs. Attorney General) සහ අනුර වීරවංශ එදිරිව නීතිපති නඩු තීන්දුව (Anura Weerasinghe Vs. Attorney General) විශ්ලේෂණය කිරීමේදී පෙනියයි (Dias & Gamble, 2006). මෙම අධ්‍යයනයේදී, සේපාල ඒකනායක එදිරිව නීතිපති නඩු තීන්දුව සහ නල්ලරත්නම් සිංගරාසා එදිරිව නීතිපති නඩු තීන්දුව ඇසුරින් ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ *අන්තර්ජාතික නීතියට ඇතුළත් අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය සහ සංධානයන් අදාළ වන ආකාරය* සහ ශ්‍රී ලංකාවේ දේශීය නීති ක්ෂේත්‍රයට අන්තර්ජාතික නීතිය අදාළ කර ගැනීමේදී මුහුණ පෑමට සිදුව ඇති ගැටලු පිළිබඳ විශ්ලේෂණය කිරීම අරමුණු කළේ ය.

මෙම අධ්‍යයනය කොටස් තුනකින් සමන්විත වේ. අධ්‍යයනයේ පළමු කොටස මගින් හැඳින්වීම, පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු සහ පර්යේෂණ ක්‍රමවේදය පැහැදිලි කරනු ලැබේ. අධ්‍යයනයේ දෙවන කොටස මගින් සාකච්ඡාව සහ විශ්ලේෂණය සිදු කෙරිණි. ඒ යටතේ අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය, නීති න්‍යාය, දේශීය අධිකරණ බලය සහ අන්තර්ජාතික නීතිය අතර පවතින සබඳතාව ය, ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික *චාරිත්‍රමය නීතිය* අදාළ වන ආකාරය සහ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික සංධානයන් අදාළ වන ආකාරය තුළනාත්මක ව විශ්ලේෂණය කළේ ය. අධ්‍යනයේ තුන්වන කොටස මගින් නිගමයන් ඉදිරිපත් කළේ ය.

## පර්යේෂණ ගැටලුව

මෙම අධ්‍යයනයේ, අධ්‍යයන ගැටලුව වන්නේ අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය එකම නීති පද්ධතියක් ද? නැද්ද? යන්න යි.

## පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන අධ්‍යයන අරමුණු දෙකක් විමර්ශනයට ලක්කොට ඇත.

අ. ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතිය අදාළ වන ආකාරය විශ්ලේෂණය කිරීම.

ආ. *ශ්‍රී ලංකාවේ දේශීය නීති ක්ෂේත්‍රයට අන්තර්ජාතික නීතිය අදාළ කර ගැනීමේදී මුහුණ පෑමට සිදුවී ඇති ගැටලුන් මොනවා ද? යන්න විශ්ලේෂණය කිරීම.*

## පර්යේෂණයේ වැදගත්කම

අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය එකම නීති පද්ධතියක් ද යන්න විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබීම මෙම අධ්‍යයනයේ වැදගත්කම යි.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 213-226
ISSN 1800-1459

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ද්විතියික මූලාශ්‍රය ඇසුරෙන් කෙරෙන විශ්ලේෂණයකි. ද්විතික දත්ත පොත්පත්, සඟරා, පුවත්පත් සහ අන්තර්ජාලය ආශ්‍රයෙන් රැස් කෙරිණි. රැස්කරගත් දත්ත විස්තරාත්මක ක්‍රමය සහ තුළනාත්මක ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කොට ඇත. එහි දී පර්යේෂණයේ ඇතැම් කරුණු තහවුරු කිරීම සඳහා සෘජු හා වක්‍ර උද්ධෘත භාවිතකොට ඇත

## සාකච්ඡාව

### අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය

වර්තමානයේ දී අන්තර්ජාතික නීතිය හා දේශීය නීතිය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ කරවන අවස්ථා වැඩිවෙමින් පවතී. අන්තර්ජාතික නීතිය අන්තර්ජාතික සමාජයේ තුළ ක්‍රියාත්මක වන ජාතික රාජ්‍යයන් (Nation States) සහ අනෙකුත් පාත්‍රයන් (Other Actors) අතර සබඳතා මෙහෙයවීමේ දී ප්‍රමුඛ ව බලපාන නීතිය වේ. මීට වෙනස්ව දේශීය නීතිය ජාතික රාජ්‍යයන් තුළ ප්‍රමුඛ ව බලපාන නීතිය වේ. මෑතක පටන් අන්තර්ජාතික නීතිය බලපාන ක්ෂේත්‍ර මෙන් ම එහි විෂය ක්ෂේත්‍රය ද පුළුල් වී ඇත. අතීතයේදී රාජ්‍යයන් අතරේ සබඳතා පමණක් පාලනය කළ අන්තර්ජාතික නීතිය, නූතනයේ අන්තර්ජාතික ආයතන හා පුද්ගලයන් සම්බන්ධ ව ද බලපෑම් කිරීම අරඹා ඇත. අතීතයේදී රාජදූත සම්බන්ධතා හා යුද්ධ වලට පමණක් සීමා වූ අන්තර්ජාතික නීතිය, නූතනයේ සාමාජීය, සෞඛ්‍ය, අධ්‍යාපන හා ආර්ථික අංශයන් මෙහෙයවීමට ද පටන් ගෙන ඇත. සංධානයන් අන්තර්ජාතික නීති ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වූව ද, බොහෝ රාජ්‍යයන්ට ඒවා තම රාජ්‍ය තුළ බලාත්මක කිරීම සඳහා ජාතික ව්‍යවස්ථාදායකයන්ගේ නීති පැනවීම අවශ්‍ය වී ඇත. නිදසුන් ලෙස තානාපති විනිර්මුක්තිය (Diplomatic Immunity) අන්තර්ජාතික නීතිය මඟින් ස්ථාපිතකොට ඇතත්, දේශීය නීතිය මඟින් ඒවා පිළිගෙන ආරක්ෂා නො කළහොත් එකී විනිර්මුක්තිය නිෂ්ඵල වේ. එකී විනිර්මුක්තිය ආරක්ෂා කර ගැනීම සඳහා අන්තර්ජාතික ආයතන නොමැති හෙයින් ජාතික අධිකරණයේ ආධාරය අත්‍යවශ්‍ය වේ. උද්පණය (Extradition) ගත් කල එය ද ඒ ආකාර වේ. උද්පණයට අදාළ සංධානයන් අන්තර්ජාතික නීතියේ චාරිත්‍රමය රීතින් අර්ථනිරූපණය කළ යුතු වන්නේ ජාතික රාජ්‍යයේ අධිකරණය මගින් වේ (Edwin, 1940; Verma, 1998:10-20).

අන්තර්ජාතික නීතිය, අන්තර්ජාතික කටයුතු සම්බන්ධයෙන් බාධා රහිත ව බලපාන බව අවිවාදයෙන් පිළි ගත යුතු වේ. අලබාම සමථ කිරීමේදී (Alabam Claims Arbitration) දක්වා ඇති අයුරු රාජ්‍යයන් අන්තර්ජාතික වගකීමකට බැඳී ඇති විටෙක තම දේශීය නියෝග වලින් බාධා පැමිණීම නිදහසට කාරණයක් වශයෙන් ඉදිරිපත් කළ නො හැකි ය (ඩයස් 1997). රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන කෙටුම්පතේ (Draft Declaration on Rights and Duties of States) 13 වන වගන්තියේ දක්වා ඇති පරිදි ජාතික රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ වෙනත් නීතියක් මගින් පැමිණෙන බාධා මත රාජ්‍යයන් විසින් තම සංධානීය හෝ වෙනත් අන්තර්ජාතික නීතිමය වගකීම්වලින් වැළකීම

සඳහා ඉදිරිපත් කෙරෙන හේතු අන්තර්ජාතික නීතිය පිළිගන්නේ නැත. සංධානයන් පිළිබඳ වියානා සම්මුතියේ 27 වන වගන්තියට (Vienna Convention on the Law of Treaties - Article 27) අනුව ජාතික නීති මගින් පැමිණෙන බාධා සංධානීය වගකීම් පැහැර හැරීමට තරම් යුක්ති සහගත නොවේ (ඩයස්, 1997: 19). මෙසේ දේශීය නීතියෙන් පැමිණෙන බාධා අන්තර්ජාතික නීතිමය වගකීම් පැහැර හැරීම සඳහා හේතුපාදක කරගත නොහැකි බව සඳහන්වූවත්, යථාර්ථය බවට පත්ව ඇත්තේ අන්තර්ජාතික නීතිය, දේශීය නීති ක්ෂේත්‍රයට අදාළ කර ගැනීමේදී යම් යම් ගැටලු පැන නැගීමයි.

## නීති න්‍යාය

අන්තර්ජාතික නීතිය හා දේශීය නීතිය අතර පවතින සබඳතාව නීති න්‍යායන් දෙකක් ඔස්සේ විග්‍රහ කළ හැකි ය.

1. ඒකීය න්‍යායවාදය (Theory of Monism)
2. ද්වීත්ව න්‍යායවාදය (Theory of Dualism)

### ඒකීය න්‍යායවාදය

ඒකීය න්‍යාවාදය ට අනුව අන්තර්ජාතික නීතියත්, දේශීය නීතියත් එකම පොදු ගණයකින් පැවතෙන නීති දෙවර්ගයක් වේ. එනම්, නීතිය යනු බලගතු අණකි. ලොව සෑම නීතියක් ම (අන්තර්ජාතික, දේශීය හෝ ගෝත්‍රික) මෙම බලගතු අණට අනුරූප වන තාක් බලාත්මක වේ. ඊට පිටුපා යන නීති, නීති නොවේ (Dias & Gamble, 2006: 448). ප්‍රධාන වශයෙන් ස්වාභාවික නීතිවේදීහු (Natural Law Jurists)[1] අන්තර්ජාතික නීතිය හා දේශීය නීතිය අතර පවතින සබඳතාව විශ්ලේෂණය කිරීම සඳහා ඒකීය න්‍යායවාදය අනුගමනය කරති. නීතිය ක්‍රමානුකූලව සැකසී ඇති බව ස්වාභාවික නීතිවේදීන්ගේ මතයයි. ඔවුන්ට අනුව නීතිය මුලින් ම දේව නීතිය ද, දෙවනුව ස්වාභාවික නීතිය ද, තෙවනුව ජාතීන් සියල්ලට ම පොදු අන්තර්ජාතික නිතීය ද, අවසන් වශයෙන් දේශීය නීතිය ද යන පිළිවෙළ අනුව සැකසී ඇත. එමෙන් ම සියලු ම නීතීන් ස්වාභාවික නීති මූලධර්මයන්ට අනුකූල විය යුතු බවට ද මොවුන් තර්ක කරති. හැන්ස් කෙල්සන් (Hans Kelson) සහ හෙර්ස්ච් ලෝටර්පැට් (Hersch Lauterpacht) ඒකීය න්‍යායවාදය වෙනුවෙන් කරුණු දක්වා සිටින ප්‍රධාන නීතිවේදීහු වෙති. මොවුහු ද්වීත්ව න්‍යායවාදීන්ගේ ඉගැන්වීම්, එනම් අන්තර්ජාතික නීතිය හා දේශීය නීතිය එකිනෙකට වෙනස් නීති පද්ධතින් බැවින් ඒවායේ නීති මූලාශ්‍රයන් හා විෂයධාරාවන් වෙනස් වේ යන අදහස ප්‍රතික්ෂේප කරති. එමෙන් ම ඒකීය න්‍යායවාදී මතයට අනුව අන්තර්ජාතික නීතිය, දේශීය නීතියට වඩා උසස් වේ. දේශීය නීතිය මගින් අන්තර්ජාතික නීතිය ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයෝ බැඳී සිටිති. මෙම න්‍යායට අනුව අවසාන විශ්ලේෂණයේදී දේශීය නීතිය අන්තර්ජාතික නීතියට යටත් වේ. රාජ්‍යයන් පමණක් නොව අන්තර්ජාතික ආයතන හා පුද්ගලයන් ද අන්තර්ජාතික නීතියේ විෂයධරයෝ වෙති. පුද්ගලයා දේශීය නීතියට යටත් වන අතර, දේශීය නීතිය, අන්තර්ජාතික නීතියට යටත් වන බැවින් අන්තර්ජාතික නීතිය වඩාත් උසස් වේ. ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය, ඕස්ට්‍රියාව වැනි රාජ්‍යයන් ඒකීය න්‍යායවාදය අනුගමනය කරන රාජ්‍යයන් ලෙස හඳුනාගත හැකි වේ (Edwin, 1940; Lauterpacht, 1982; Verma, 1998).

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 213-226
ISSN 1800-1459

## ද්වීත්ව න්‍යායවාදය

ද්වීත්ව න්‍යාවාදය ට අනුව අන්තර්ජාතික නීතිය හා දේශීය නීතිය යනු එකිනෙකට වෙනස් නීති පද්ධති දෙකක් වේ. එනම්, අන්තර්ජාතික නීතියේ සහ දේශීය නීතියේ විෂයධාරා ද, මූලධර්ම ද එකිනෙකට වෙනස් වේ. එක්සත් රාජධානිය, අයර්ලන්තය වැනි රාජ්‍යයන් ද්වීත්ව න්‍යායවාදය අනුගමනය කරන රාජ්‍යයන් ලෙස හඳුනාගත හැකි වේ. එච්. ට්‍රිපේල් (H. Triepel), ඩී ඇන්සිලොට් (D. Anzilotti) සහ එල්. ඕපන්හයිම් (L. Oppenheim) වැනි නීතිවේදීහු අන්තර්ජාතික නීතිය, දේශීය නීතිය හා සම්බන්ධ කිරීමෙහි ලා ද්වීත්ව න්‍යාය පිළිගනති (Dias & Gamble, 2006; Edwin, 1940; Verma, 1998). මොවුහු අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය අතර පවතින සබඳතාව පහත ආකාරයට ප්‍රධාන අනු න්‍යායන් තුනක් යටතේ විශ්ලේෂණය කරති.

I. **පරිවර්තනවාදය හෙවත් ප්‍රතියෝජන න්‍යාය (Theory of Transformation)** - මෙම න්‍යායට අනුව දේශීය නීතිය අන්තර්ජාතික නීතියට වඩා උසස් වේ. එබැවින්, ස්වෛරී බලය දරන රාජ්‍යයන් විසින් තම දේශීය නීතිය හා නොගැටෙන අන්තර්ජාතික නීතියේ රීතින්, බාහිර බලපෑමකින් තොරව ස්ව කැමැත්තෙන් ම දේශීය නීතිය බවට පරිවර්තනය කර ගනු ලබන බව මෙම න්‍යාය මගින් තර්ක කරයි (ඩයස්, 1997).

II. **සකසා ගැනීම නැතහොත් සහයෝජන න්‍යාය (Theory of Harmonization)** - මෙම න්‍යාය වඩාත් උපකාරී වන්නේ අන්තර්ජාතික නීතිය, දේශීය නීතියට අදාළ කර ගැනීමේදී පැනනගින ඝට්ටන අවම කර ගැනීම සඳහා වේ. අන්තර්ජාතික නීතියේ රීතියක් හා දේශීය ව්‍යවස්ථාපිත නීතියක් හෝ අධිකරණ පූර්වාදර්ශයක් සමඟ ගැටීමක් මතු වූ විට, ඒ ඝට්ටන අවම ප්‍රමාණයක තබා ගැනීමට හෝ ඝට්ටන නැති කර ගැනීමට හැකි අයුරින් ජාතික අධිකරණය නීතිය අර්ථ නිරූපණය කරයි. මෙම න්‍යායේ පදනම වන්නේ උචිත අර්ථ නිරූපණ රීතින් (Rules of Interpretation) භාවිත කර ගැනීම මගින් ගැටුම් නැතිකර ගැනීම හෝ ගැටුම් අඩුකර ගැනීමයි (ඩයස්, 1997).

III. **සමාජවාදී න්‍යාය (Theory of Socialism)** - බුක්ටෙක්වික් නැමති රුසියානු අභ්‍යන්තර නීතිවේදියා විසින් දක්වා ඇති ආකාරයට, ඒකීය මෙන්ම ද්වීත්ව න්‍යායවාදය යල්පැන ගොස් ඇත. වැදගත් වන්නේ මාක්ස්වාදී මූල සංකල්පය වන 'ද්විසට්ටනාත්මක' (Dialectic) ධර්මය මත පදනම් වූ නීතිය පිළිබඳ සමාජවාදී න්‍යායයි (ඩයස්, 1997).

## දේශීය අධිකරණ බලය සහ අන්තර්ජාතික නීතිය

අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය එකම නීති පද්ධතියක් ද? නැද්ද? යන්න ශාස්ත්‍රීය පැනයක් බවට පත්ව තිබේ. බොහෝවිට මේ නීති දෙවර්ගය ම එකම නීතියක් යන පොදු වර්ගයකට වැටෙන සේ සලකා අධිකරණය කටයුතු කරයි. අවස්ථානුකූල ව දේශීය අධිකරණයන් දේශීය නීතිය මෙන්ම අන්තර්ජාතික නීතිය ද ප්‍රත්‍යක්ෂයන් කෙරෙහි බලාත්මක කර ඇත. නවීන ලෝකයේ විෂමතා අනුව නීති දෙවර්ගය ම පෙරට වඩා සීඝ්‍රයෙන් බොහෝවිට අන්‍යෝන්‍ය

සුහදතාවෙන් ද, අනෙක් විට ගැටුම්වලට මැදිව කටයුතු කිරීමට පෙළඹී ඇත. රාජ්‍යයන් පිළිගැනීම, රාජ්‍යයන්ගේ අනුප්‍රාප්තිය, ජාතිකත්වය, උද්ර්පණය හා තනාපති සම්බන්ධතා වැනි බොහෝ අන්තර්ජාතික විෂයන් සම්බන්ධිත රීති හා තීරණ ක්‍රියාත්මක කිරීමේදී දේශීය නීතිය උපයෝගීකර ගැනීම සිදු වේ. රාජ්‍යයන් විසින් අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය, දේශීය නීතිය බවට පරිවර්තනය කර ගන්නා ආකාරය, සන්ධානයන් දේශීය නීතිය බවට පරිවර්තනය කරගන්නා ආකාරයට වඩා වෙනස් වේ. එය ශ්‍රී ලංකාව අනුගමනය කරන ක්‍රියා කලාපය විශ්ලේෂණය කිරීමෙන් අවබෝධ කර ගැනීමට මෙතැන් සිට උත්සාහ ගැනේ.

## ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය සහ අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය

ශ්‍රී ලංකාව දේශීය අධිකරණ බලය[2] තුළ අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය සහ ඕස්ට්‍රියාව අනුගමනය කරන පිළිවෙත වන ඒකීය න්‍යායවාදය අනුගමනය කරනු ලබයි. එනම්, පාර්ලිමේන්තු පනත් හා නොගැටෙනතාක් දුරට පමණක් අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය අධිකරණය පිළිගනියි. එමෙන් ම අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය ආරෝපන න්‍යායට අනුකූල ව දේශීය නීතිය බවට පත් වේ. ආරෝපනය කිරීම හේතුකොටගෙන නීති ක්ෂේත්‍රයන් දෙක අතර ගැටුමක් ඇති වූ විට රටේ පවතින දේශීය නීතිය මුල්තැන ගනී. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (ඊ) වගන්තිය මගින් සපයා ඇත. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (ඊ) වගන්තියට අනුව, පූර්ණ විධායක බලය දරන ජනාධිපතිවරයා සෑමවිට ම අන්තර්ජාතික පරිචයන්ට (Usages) හා අන්තර්ජාතික චාරිත්‍රමය නීතියට පටහැනි නොවන ආකාරයට කටයුතු කළ යුතු ය.

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වලට පටහැනි නොවන්නා වූ ද අන්තර්ජාතික නීතිය, චාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ඔහුට නියමිතව හෝ බලය ලැබී ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය" (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978:161)

ව්‍යවස්ථාපිත නීතියක් නැති වූ විට පමණක් අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය ශ්‍රී ලංකා නීතිය වශයෙන් ආරෝපනය කරගත හැකි බව සේපාල ඒකනායක එදිරි ව නීතිපති නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර ඇත. චූදිතයා 1982 ජුනි 30 වන දින ඉතාලියට අයත් අහස් යානාවක් කොල්ල කෑම පිළිබඳ ව මහාධිකරණය විසින් වරදකරු බව තීන්දු කළේ ය. වරද සිදු කෙරුණු අවස්ථාවේදී අහස්යානා කොල්ලය සම්බන්ධ ව්‍යවස්ථාපිත නීතියක් යටතේ අපරාධයක් නොපැවතුණි. සිද්ධියෙන් පසුව 1982 අහස් යානාවන්ට එරෙහි ව කරනු ලබන වැරදි පිළිබඳ පනත (Offences Against Air - Crafts Act - 1982) පනවන ලදී. එසේ නමුත් ගුවන් කොල්ලය (Sky - Jacking) අන්තර්ජාතික නීතියට විරුද්ධ අපරාධයක් බවට පත්කර තිබුණු සංධානයන් තුනකට ශ්‍රී ලංකාව ද පාක්ෂිකයෙකුව සිටියේ ය. ඒ සන්ධානයන් 1982 පනත යටතේ ව්‍යස්ථාපිත නීති බවට පත් කළේ ය. ඒවා නම්;

I. 1963 අහස්යානා තුළ කරන ලද අපරාධ හා වෙනත් ක්‍රියා පිළිබඳ ටෝකියෝ සම්මුතිය (The Tokyo Convention)

II. 1970 අහස්යානා නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීම අහෝසි කිරීමේ හෙග් සම්මුතිය (The Hague Convention)

III. 1971 අහස්යානා ගමනාගමනයට එරෙහි ව කරන සෑම නීති විරෝධී ක්‍රියාවක් ම අහෝසි කිරීමේ මොන්ට්‍රියෙල් සම්මුතිය (The Montreal Convention) (Verma, 1998: 10-20).

විත්තියේ තර්කය වූයේ 1982 පනත යටතේ චූදිතයා වරදකරු කරවීම අතීතයට බලපාන (post facto) නීතියක් යටතේ වරදකරුවෙකු කිරීමක් හෙයින්, මෙය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (6) උප වගන්තිය උල්ලංඝණය කිරීමක් බවයි. එම වගන්තිය පහත පරිදි වේ;

> "යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේදී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවී නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු වරදකට වරදකරුවකු නොවිය යුත්තේ ය. තවද යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත් වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය" (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978:133).

නීතිපතිගේ තර්කය වූයේ චූදිතයා වරදකරු කරන ලද්දේ 1982 පනත යටතේ නොව, අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය යටතේ අපරාධයක් වන ගුවන් කොල්ලය නැමැති වරදට බවයි. එනම්, ශ්‍රී ලංකා නීතියට අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය ආරෝපනය කර ගැනීමෙන් දේශීය නීතිය බවට පත්වීම හේතුකොටගෙන චූදිතයා වරදකරු කරවීම නීත්‍යානුකූල බවයි. අභියාචනාධිකරණය ද නීතිපතිගේ තර්කය පිළිගනිමින් මහාධිකරණය විසින් දී ඇති තීරණය අනුමත කළේ ය. අනතුරු ව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචනායේදී ද සේපාල ඒකනායක වරදකරු බවට තීන්දු විය (http://www.lankalibrary.com/phpBB/viewtopic.php?p=6384).

මේ අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය අදාළ කර ගැනීම සම්බන්ධයෙන් දේශීය නීතියට යටත් ව ඒකීය න්‍යායවාදය අනුගමනය කරන බවයි. එනම්, අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය ශ්‍රී ලංකාව දේශීය නීතිය විවරණය කිරීමේදී මූලාශ්‍රයයක් වශයෙන් යොදා ගන්නා බවයි.

## ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය සහ අන්තර්ජාතික සංධානයන්

දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික සංධානයන් අදාළ වන ආකාරය සම්බන්ධයෙන් නැතහොත් සංධානයන් දේශීය නීතිය බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අන්තර්ජාතික චාරිත්‍රමය නීතියට හාත්පසින් ම වෙනස් ක්‍රියාදාමයක් අනුගමනය කරයි. 1972 හා 1978 ව්‍යවස්ථාවන්හි සංධානයන් වලට එළඹෙන්නේ කෙසේ ද? යන්න පිළිබඳ ව පැහැදිලි ක්‍රියාපටිපාටියක් දක්ව නැත. ඒසේම 1972 ව්‍යවස්ථාව යටතේ අගමැතිට හෝ 1978 ව්‍යවස්ථාව යටතේ

ජනාධිපතිවරයාට නැතිනම් පාර්ලිමේන්තුවට සංධානයන්ට එළඹිය හැකි බව පැහැදිලිව නො දක්වයි. නමුත් 1978 ව්‍යවස්ථාවේ 157 වගන්තිය මගින් ජාතික ආර්ථිකයට අනුකූල ද්විපාර්ශවික ආයෝජන ගිවිසුම්වලට එළඹිය හැකි බවට විධිවිධාන සපයා ඇත.

> "ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ යම් විදේශ රාජ්‍යයක ආණ්ඩු අතර, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත් යම් ගිවිසුමක් හෝ සම්මුතියක් ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යවශ්‍ය වන්නක් බව, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළු ව) මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් පක්ෂව ඡන්දය දී සම්මත කරනු ලබන යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ ගිවිසුමට හෝ සම්මුතියට ශ්‍රී ලංකාව තුළ නීතියේ බලපෑම ඇති කර රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස හැර, ඒ ගිවිසුමේ හෝ සම්මුතියේ විධිවිධාන කඩ කෙරෙන කිසිම ලිඛිත නීතියක් පැනවීම හෝ සෑදීම ද විධායක හෝ පරිපාලන ක්‍රියාවක් කිරීම ද නොකළ යුත්තේ ය" (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978: 345).

මේ අනුව එක්සත් රාජධානිය හා අයර්ලන්තය මෙන් ශ්‍රී ලංකාව ද දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික සංධානයන් අදාළ කර ගැනිමේදී ද්විත්ව න්‍යායවාදය අනුගමනය කරන බව පැහැදිලි වේ. ජනාධිපතිවරයා විසින් අත්සන් තබා ස්ථිර කරන ලද සංධානයන් පාර්ලිමේන්තුවේ සම්පූර්ණ මන්ත්‍රීන්ගේ ගණනින් තුනෙන් දෙකක ඡන්දයෙන් අනුමත කර ගත යුතු ය. එක්සත් රාජධානිය මෙන් ශ්‍රී ලංකාවේ ද අත්සන් කරන ලද සංධානය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව අනුමත කර ස්ථිර කරගනු ලැබිය හැකිය. එසේ නැතිනම් අනුමත කර ස්ථිර කරනු ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. බහු පාර්ශවික ගිවිසුමක් සම්බන්ධයෙන් නම් වඩා යෝග්‍ය වන්නේ පාර්ලිමේන්තුවේ, අනුමැතිය ලබා ගැනිමෙන් පසුව අනුමත කර ස්ථිර කිරීමය. ඉහත සඳහන් අවස්ථාවන් අනුගමනය නොකළ විටෙක ව්‍යවස්ථාපිත බලය නොතිබීමෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නොකළ හැකි ගිවිසුම් කොන්දේසි කඩවීම නිසා, අන්තර්ජාතික ක්ෂේත්‍රයේ දී වගකීම් කඩවීම සම්බන්ධයෙන් පමණක් වන්දි ගෙවීමට සිදු වේ.

දේශීය නීතිය බවට පරිවර්තනය නොවූ එනම්, අනුමත කළ නමුත් නීතිගත කර නැති සංධානයන් හෝ ප්‍රකාශනයක් ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ වලංගු නොවන බව (අදාළ නොවන බව) හිටපු අගවිනිසුරු සරත් එන්. සිල්වා විසින් නල්ලරත්නම් සිංගරාසා එදිරිව නීතිපති නඩුවේදි සඳහන් කරනු ලැබීය. නීත්‍යානුකූල නොවන ක්‍රියාමාර්ග ඔස්සේ 1990 මැයි 01 වන දින සිට 1991 දෙසැම්බර් 31 වන දින දක්වා පැවති රජය බලයෙන් නෙරපා දැමීම සඳහා සිංගරාසා විසින් අශෝක පලරාජ්, ස්වර්නම්, පොට්ටු අම්මාන්, දිනේෂ් හා සුසිකුමාර් ඇතුළු තවත් කණ්ඩායමක් සමඟ යාපනය, කන්කසන්තුරය සහ

පලාලි යුද හමුදා කඳවුරු වලට පහරදීමට කුමන්ත්‍රණය කිරීම සැලකිල්ලට ගෙන සිංගරාසාට එරෙහි ව මහාධිකරණයේ නඩු පැවරිණි. එම නඩු පැවරීම 1979 අංක 48 දරණ හදිසි නීතිය සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (The Emergency Regulations and the Prevention of Terrorism (Temporary Provisions) Act No. 48 of 1979) යටතේ සිදු කළේ ය. ද්‍රවිඩ ජාතිකයෙකු වූ සිංගරාසාට එරෙහි ව මෙම නඩුව පවරන විට සිංහරාසා අවුරුදු 20 ක තරුණයෙක් විය. පාසල් අධ්‍යාපනය නො ලැබූ මොහුට ද්‍රවිඩ භාෂාව ලිවීමට හෝ කියවීමට නො හැකි වූ අතර, කථාකිරීමට පමණක් සමතෙක් විය. සිංගරාසා ඉහත කුමන්ත්‍රණය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමෙන් පසු සාක්ෂි සටහන් කරනු ලැබූ පොලිස් නිළධාරියාට ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදු විය. එනම්, පෙර සඳහන් කළ පරිදි සිංගරාසාට ද්‍රවිඩ භාෂාව කථා කිරීමට හැකියාව තිබූ නමුදු ඔහුට ද්‍රවිඩ භාෂාව ලිවීම හෝ කියවීම සම්බන්ධ ව දැනුමක් නො විය. එසේ වුවත් මෙම සාක්ෂ්‍ය සටහන් කරනු ලැබූ පොලිස් නිළධාරියා ද දෙමළ භාෂාව කථා කළහැකි අයෙකු වූ අතර, ඔහු ද සිංහරාසා මෙන් දෙමළ භාෂාව ලිවීමට හෝ කියවීමට නොදත් අයෙකි. කෙසේ වෙතත් තම හැකියාව ප්‍රයෝජනයට ගත් පොලිස් නිළධාරීයා සිංගරාසා ද්‍රවිඩ භාෂාවෙන් පැවසූ සාක්ෂ්‍ය සිංහලට පරිවර්තනය කර වාර්තා කළේය. පසුව පොලිස් නිළධාරීයා සිංහල බසින් ලියන ලද සාක්ෂ්‍ය ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කර සිංගරාසාට ඇසෙන සේ කියෙව්වේය. එසේ අසා සිටීමෙන් පසු සිංගරාසා වාර්තාව සඳහා කන අත්සන (Thumb Impression) තබනු ලැබීය. පසුව ඉහත වැරදි මත පදනම්ව සිංගරාසාට එරෙහිව මහාධිකරණයේ නඩු පැවරුණි. මහාධිකරණය සියලු සාක්ෂි විභාගයෙන් පසුව සිංගරාසාට එරෙහිව ගොනුකළ සියළු වැරදි සම්බන්ධයෙන්, ඔහු වැරදිකරු කරමින් වසර 10 ක සිරදඬුවමකට යටත් කළේය (http://www.ruleoflawsrilanka.org/cases/un-cases-for-sri-lanka/special-case-supreme-court-on-nallarathnam). පසුව මහාධිකරණයේ තීන්දුව අභියෝගයට ලක් කරමින් අභියාචනාවක් පෙත්සමක් මාර්ගයෙන් අභියාචනාධිකරණයට ඉදිරිපත් කිරීමට සිංගරාසා වෙනුවෙන් පෙනීසිටි නීතිඥයෝ ක්‍රියා කළෝය. 1999 ජුනි 23 සිට 1999 ජුලි 6 දක්වා කාලය තුළ අභියාචනාධිකරණ විනිශ්චකරුවන් මණ්ඩලයක් මගින් අදාළ පෙත්සම විභාග කිරීමෙන් අනතුරු ව සිංගරාසාගේ දඬුවම් කාලය වසර 7 ක් දක්වා අඩු කළේය. එම තීන්දුව ද අභියෝගයට ලක් කරමින් සිංගරාසා නැවතත් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනාවක් ඉදිරිපත් කළේ ය. එම අභියාචනාව පිළිබඳ ව කරුණු සොයා බැලීම සඳහා මාක් ප්‍රනාන්දු, ජේ. වඩුගොඩපිටිය සහ ජේ. විජේතුංග ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකරුවන්ගෙන් සමන්විත විනිසුරු මණ්ඩලයක් පත් කළේ ය. එම මණ්ඩලය අභියාචනාව සලකාබැලීමෙන් පසු එම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චය කිරීම ප්‍රතික්ෂේප කරමින්, 2000 ජනවාරි 28 තම මතය ප්‍රකාශයට පත් කළේ ය (Xavier (et.al) 2005:6).

මෙසේ ශ්‍රේෂ්ඨාධිකරණය අභියාචනාව ප්‍රතික්ෂේප කිරීමෙන් පසු සිංගරාසා තමන්ගේ අයිතිවාසිකම් කියාපාමින්, පෙත්සමක් ජිනිවාහි පිහිටි මානව හිමිකම් කමිටුවට (Human Rights Committee - HRC) 2001 ජුනි 19 වන දින ඉදිරිපත් කළේ ය. එහිදී සිංගරාසා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තමන්ගේ අභියාචනාව විනිශ්චය කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1966 දෙසැම්බර් 16 වන දින ප්‍රකාශයකට පත් කළ සහ ශ්‍රී ලංකාව විසින් 1980 ජුනි 11

ISSN 1800-1459

වන දින අනුමත කළ "සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ" (The International Covenant on Civil and Political Rights) පහත අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට කරුණු පෙන්වා දුන්නේය;

> **02 වන වගන්තිය** -"I. මෙම සම්මුතියට ඇතුළත් ඒ ඒ රාජ්‍ය පාර්ශ්වකරුවෝ මෙම සම්මුතියෙහි පිළිගැනෙන අයිතිවාසිකම් වලට ගරු කිරීමටත් වර්ගය, වර්ණය, ස්ත්‍රීපුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලනය ආදී වෙනත් කවර භේදයක් හෝ ජාතික හෝ සමාජ සම්භවය, දේපල, උපත හෝ වෙනත් තත්ත්වයන් කෙරෙහි කිසිදු විශේෂයක් නොමැතිව සිය දේශසීමාව ඇතුළත ද සිය අධිකරණ බල සීමාවට යටත්ව ද සියලු ම පුද්ගලයන්ට උරුම වන බවට වන බලා ගැනීමටත් පොරොන්දු වෙති.
>
> II. පවත්නා ව්‍යවස්ථාව හෝ වෙනත් වැඩ පිළිවෙළවල් අනුව එවකටත් විධිවිධාන සැලසී නොමැති විට, මෙම සම්මුතියට ඇතුළත් ඒ ඒ රාජ්‍ය පාර්ශවකරුවෝ මෙම සම්මුතියෙහි පිළිගනු ලබන එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කරනු සඳහා අවශ්‍ය ව්‍යවස්ථා ඇති කිරීමට හෝ වෙනත් අවශ්‍ය වැඩ පිළිවෙළවල් ඇති කිරීමට සිය ව්‍යවස්ථා පද්ධති හා මෙම සම්මුතියෙහි විධිවිධාන අනුව පියවර ගනු ලබන බවට පොරොන්දු වෙති."
>
> **07 වන වගන්තිය** - "කිසිම පුද්ගලයෙකු වධ හිංසාවකට හෝ කෘර අමානුෂික හෝ පහත් සැලකීමකට හෝ දඬුවමකට භාජනය නොකල යුතු ය."
>
> **14 වන වගන්තිය** - "සියලු දෙනා ම අධිකරණ සහ විනිශ්චයාධිකරණය ඉදිරියෙහි එක සමාන වන්නා හ. සෑම කෙනෙකුට ම තමාට විරුද්ධව නගා ඇති ඕනෑම සාපරාධී චෝදනාවක් සම්බන්ධව නීතිය විසින් ප්‍රතිෂ්ඨාපිත ප්‍රවීණ, ස්වාධීන සහ අපක්ෂපාත විනිශ්චයාධිකරණයක් විසින් කරනු ලබන සාධාරණ හා ප්‍රසිද්ධ නඩු විභාගයකට හිමිකම් ඇත්තේ ය."
>
> **26 වන වගන්තිය** - "සියලු ම තැනැත්තෝ නීතිය ඉදිරියෙහි එක සමාන වන්නා හ. තවද කිසිම ප්‍රභේදයකින් තොරව නීතියේ සමාන රැකවරණ ලැබීමට හිමිකම් ඇත්තතේ ය. මේ සම්බන්ධයෙන් ඕනෑම වෙනස්කමක් නීතියෙන් තහනම් විය යුතු අතර, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතික හෝ සමාජීය සම්භවය, දේපළ, උත්පත්තිය හෝ වෙනත් තත්ත්වයන් යන යම් හේතුවක් මත වෙනස්කම් කිරීමට විරුද්ධව සමාන සහ කාර්යසාධක රැකවරණ නීතියෙන් සහතික කළ යුතු ය" (අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත 1998:31-44).

පෙත්සම 2004 ජුලි 21 විභාග කළ මානව හිමිකම් කමිටුව තම මතයන් හා නිර්දේශයන් 2004 අගෝස්තු 23 වන දින ලිපියක් මගින් ශ්‍රී ලංකා රජයට දැනුම් දුන්නේය. එම ලිපිය තුළ අඩංගු මතයන් හා නිර්දේශයන් පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය සිංගරාසා නඩුව විභාග කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2, 7, 14 සහ 26 වන වගන්ති උල්ලංඝණය වී තිබීම.
2. ශ්‍රී ලංකා රජයට දින 90 ක කාලයක් කමිටුවේ මතය ක්‍රියාත්මක කිරීමට ලබාදීම.
3. කළුතර බන්ධනාගාර ගත කර ඇති සිංගරාසා නිදහස් කිරීමට සුදුසු යැයි යෝජනා කිරීම.
4. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ජාත්‍යන්තර මානව හිමිකම් හා සම්බන්ධ සම්මතයන් (Norms) හා ප්‍රමිතීන්ට (Standards) අනුකූල වන ආකාරයට සංශෝධනය කිරීම (Xavier (et.al) 2005:11).

මෙම මතයන් හා නිර්දේශයන් සම්බන්ධ මානව හිමිකම් කමිටුවේ අභියාචනය ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කළේ ය. එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු වශයෙන් දැක් වූයේ, ශ්‍රී ලංකා රජය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 1980 දී ත්, එහි වෛකල්පික ගිවිසුම 1997 දී ත් අනුමත කළත් (Ratified), එය ශ්‍රී ලංකාවේ දේශීය නීතිය තුළ නීති ගතකර (Incorporated) නොමැති බැවින් එම වෛකල්පික සන්ධානයන් පිළිගැනීමට ශ්‍රී ලංකාව බැඳී නැති බවයි. වෙනත් ලෙසකට පවසන්නේ නම් වෛකල්පික සන්ධානයන් අනුමත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවයි. මෙමගින් අවබෝධ වන්නේ ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික සංධානයන් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ඒකීය න්‍යායවාදයට වෙනස්ව ද්විත්ව න්‍යායවාදය අනුගමනය කරන බවයි. එනම්, දේශීය නීතිය බවට පරිවර්ථනය නොවූ වෛකල්පික සංධානයන් හෝ ප්‍රකාශනයන් ශ්‍රී ලංකාවේ අධිකරණ බලය තුළ වලංගු නොවෙන බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉහත මතය සන්ධානීය නියෝගයන්ට පමණක් සීමා කළ විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වගන්තිය යුක්ති සහගත අයුරින් විවරණය කිරීමක් වශයෙන් සඳහන්කළ හැකිය. එසේ වුවද, 1945 එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (UN Charter), 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (Universal Declaration of Human Rights of 1948), 1966 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (The International Covenant on Civil and Political Rights of 1966) හා 1966 ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (The International Covenant on Economic, Social and Cultural Right of 1966) වැනි අන්තර්ජාතික නීති බවට පත්වූ සන්ධානයන් සහ ප්‍රකාශනයන් සිංගරාසා එදිරිව නීතිපති නඩුවේදී නොසලකා බැහැර කිරීම යෝග්‍ය නොවේ. අනෙක් අතට සිංගරාසා නඩුවේ තීරණය පිළිබඳව සැලකීමේදී එය වහල්භාවයට ලක් කිරීම, කුරිරු වදහිංසා පැමිණ වීම වැනි බලගතු අයිතීන් උල්ලංඝණය කරන්නන්ට දණ්ඩනයක් දීම සඳහා පැවතිය යුතු විනිසුම් හල් (Forums) නැතිකර දැමීමකි.

කෙසේ වෙතත් පසුකාලීන ව අන්තර්ජාතික නීතිය බවට පත්වූ සංධානයන් හෝ ප්‍රකාශනයන් ශ්‍රී ලංකාවේ දේශීය නීතිය තුළ නීති ගත කිරීම සඳහා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පනත (Civil and Political Rights Act No. 56 of

2007) කෙටුම්පත්කොට, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබී ය. මෙම පනතට එරෙහිව විවිධ පාර්ශවයන්ගෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් වූ අතර, පාර්ලිමේන්තු විවාදයන් තුළ දී විපක්ෂයේ දේශපාලන පක්ෂයන්ගේ දැඩි විවේචනයන්ට පනත ලක් විය. එහිදී ඉදරිපත් වූ ප්‍රධාන විවේචනය වූයේ, පනත ඔස්සේ ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට සහ ස්වෛරීභාවයට තර්ජන එල්ල වන බවයි. සියලු අභියෝග ජයගෙන 2007 නොවැම්බර් 16 වන දින පාර්ලිමේන්තුව පනත සම්මත කර ගත්තේය. පනත ඔස්සේ මෙතෙක් ව්‍යවස්ථානුකූලව හඳුනානොගත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් 22 ක් සඳහා ශ්‍රී ලංකාවේ දේශීය නීතිය තුළ නෛතික පදනමක් ලබාදුන්නේය. නමුත් ජීවත්වීමේ අයිතිය (Right to Life) මෙම පනත ඔස්සේ තහවුරු නොකිරීම ඉහත සාකච්ඡා කළ නෛතික ගැටලු නැවත පැනනැගීමට හේතු විය හැකි බව නීති විශාරදයන්ගේ මතය යි.

## නිගමනය

අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය එකම නීති පද්ධතියක් ද? නැද්ද? යන ශාස්ත්‍රීය පැනය ට සේපාල ඒකනායක එදිරි ව නීතිපති නඩු තීන්දුව සහ නල්ලරත්නම් සිංගරාසා එදිරි ව නීතිපති නඩු තීන්දුව ඇසුරින් පිළිතුරු සපයා ගැනීමට ගනු ලැබූ උත්සහයකි මෙම අධ්‍යයනය. ඒ අනුව, ශ්‍රී ලංකාව දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ඒකීය න්‍යායවාදය අනුගමනය කිරීමට පියවර ගෙන ඇති බව සේපාල ඒකනායක එදිරි ව නීතිපති නඩු තීන්දුව විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය විය. එනම්, අන්තර්ජාතික චාරිත්‍රමය නීතිය ශ්‍රී ලංකාව දේශීය නීතිය විවරණය කිරීමේදී මූලාශ්‍රයයක් වශයෙන් යොදා ගන්නා බව අනාවරණය විය. අනෙක් අතට ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික සංධානයන් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ඒකීය න්‍යායවාදයට වෙනස් ව ද්විත්ව න්‍යායවාදය අනුගමනය කරන බව නල්ලරත්නම් සිංගරාසා එදිරිව නීතිපති නඩු තීන්දුව විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය විය. එනම්, දේශීය නීතිය බවට පරිවර්තනය නොවූ සංධානයන් හෝ ප්‍රකාශනයන් ශ්‍රී ලංකාවේ අධිකරණ බලය තුළ වලංගු නොවෙන බවයි.

දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික ප්‍රමිතීන් අදාළ කර ගැනීමේදී ශ්‍රී ලංකාව ඒකීය න්‍යායවාදය හෝ ද්විත්ව න්‍යායවාදය අනුගමනය කරනු වෙනුවට, අවස්ථානුකූළ ලෙස මැදිහත් පිළිවෙතක් අනුගමනය කරන්නේ නම්, ලබාගත හැකි වාසි රාසියක් වේ. නූතනයේ බොහෝ රාජ්‍යයන්හි හැකි කරවන ව්‍යවස්ථා නොමැති අවස්ථාවලදී අධිකරණමය මැදිහත් වී ජනතාවට අයිතිවාසිකම් ලබා දී තිබේ. ඉන්දියාවේ විශාඛා සහ අනෙකුත් අය එදිරිව රාජස්ථාන් ප්‍රාන්ත නඩුවේ (Vishaka and Others Vs. State of Rajasthan) තීරණයන් නිදසුන් වේ. එමෙන් ම ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතිය අදාළ කර ගැනීමේදී කැනඩාව විසින් අනුගමනය කරනු ලබන පරිචය සළකා බැලීම ද වැදගත් වේ. කැනඩාව මානව හිමිකම් ප්‍රශ්නවල දී ඒකීය න්‍යායවාදයත්, මානව හිමිකම් නොවන අනෙකුත් සංධානයන් ඇතුළත් කර ගැනීම සඳහා ද්විත්ව න්‍යායවාදයත් අනුගමනය කරයි. කෙසේ වෙතත්, ඒකීය න්‍යායවාදයේ හා ද්විත්ව න්‍යායවාදයේ සංකලනයක් යොදා ගැනීම ඔස්සේ දේශීය අධිකරණ

බලය තුළ අන්තර්ජාතික ප්‍රමිතින් අදාළ කර ගැනීම සුජාතභාවයකින් (Legitimacy) යුක්ත ව කළ හැකි වේ. ඒ සඳහා අවශ්‍ය ආකාරයට වත්මන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බව අවසන් වශයෙන් මෙම අධ්‍යයනයේ දී යෝජනා කළ හැකි වේ.

## පරිශීලිත මූලාශ්‍රය

*අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත* (1998) කොළඹ, එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය

ඩයස්, නොයෙල් (1997) *ජාත්‍යන්තර හා තුලනාත්මක නීතිය*, අළුබෝමුල්ල, කුයින්ටස් ඩයස් ප්‍රකාශන

*ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව* (1972) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978)* 1978, කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

Dias, Noel & Gamble, Roger (2006) "Nallaratnam Singarasa vs. Attorney General: The Supreme Court of Sri Lanka Confirms Limited Human Rights Protection for Sri Lanka Citizens", *In Sri Lanka Journal of International Law*, Vol. 18. No.2, Colombo, University of Colombo

Edwin, Borchard (1940) "Relation Between International Law and Municipal Law", In Faculty Scholarship Series, Vol. 27. No.3, Yale Law School Faculty Scholarship, Avalable at: http://digitalcommons.law.yale.edu/fss_papers/3498, [accessed 31 June 2013]

"International Covenant on Civil and Political Rights" *(ICCPR) Act* (2007) (No. 56), Colombo, Government Publications Bureau

Lauterpacht, Hersch. (ed), (1982) *The Development of International Law by the International Court*, London, Cambridge University Press

Sivapragasam, P. P. (ed), (1998) *Universal Declararion of Human Rtghts 1948: Hand Book on Human Rghits Education*, Colombo, Human Development Organization

Verma, S. K. (1998) *An Introduction to Public International Law*, New Delhi, Prentice-Hall of India Private Limited

Xavier, I. F. (ed), (2005) "Lanaka Flouting UN Recommendation", In, *Beyond the Wall Quarterly Journal, Vol.111*, No.1, Colombo, Home for Human Rights

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 213-226
ISSN 1800-1459

*http://www.lankalibrary.com/phpBB/viewtopic.php?p=6384* [accessed 17 May 2013]

*http://www.ruleoflawsrilanka.org/cases/un-cases-for-sri-lanka/special-case-supreme-court-on-nallarathnam*, [accessed 17 February 2011]